# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත

---

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 නොවැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 16.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි

# 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 66/2003.

**රසායනික අවි වැඩි දියුණු කිරීම, නිපදවීම, රැස්කිරීම සහ භාවිත කිරීම තහනම් කිරීම, සහ ඒවා විනාශ කිරීම, පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම, සඳහා ද, ඊට සම්බන්ධ හෝ ඊට ආනුශංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

(මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රසායනික අවි නිපදවීම, වැඩි දියුණු කිරීම, රැස්කිරීම සහ භාවිත කිරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය වර්ෂ එක්දහස් නවසිය අනූ තුනේ ජනවාරි මස දහ හතර වන දින ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අත්සන් කරනු ලැබූ හෙයින් ද : පූර්විකාව.

ශ්‍රී ලංකාව එකී සම්මුතිය අනුමත කර ඇති බැවින් ද, එකී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සැදීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

## I වන කොටස

## ප්‍රාථමික කරුණු

**1.** මේ පනත 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

**2.** (1) මේ පනතේ විධිවිධාන— පනත අදාළවීම.

(අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව ඇතුළත දී සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කල යම් නැවක් හෝ ගුවන් යානයක් ඇතුළත දී ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී,

සිදු කරනු ලබන හෝ සිදු කිරීම අත් හරින ලද යම් ක්‍රියාවකට අදාළ විය යුතු ය.

2—PL 002323 -3,700 (2007/08)

(2) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී සිදු කරන ලද, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වූ නීති කෘත්‍යය, නීතිපතිවරයාගේ උපදෙස් මත හැර, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව පමණක්, යම් අධිකරණයක දී පවරනු නොලැබිය යුතු ය.

පනත මගින් රාජ්‍යය බැඳී සිටින බව.

**3**. මේ පනත මගින් රාජ්‍යය එහි සියළු තත්වයන්ගෙන් බැඳී සිටී. එසේ වුව ද, මේ පනතේ සඳහන් කිසිවක් මගින් යම් වරදක් සඳහා නඩු පවරනු ලැබීමට රාජ්‍යය යටත් වන බවට පත් කරනු නොලබයි.

මේ පනත බලාත්මක වීම නතර කල යුතු බවට ප්‍රකාශ කිරීමේ බලතල.

4. (1) ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ඒ සම්මුතියේ XVI ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා රජය ඒ සම්මුතියෙන් ඉල්ලා අස්වන අවස්ථාවකදී, මේ පනතේ විධිවිධාන බලාත්මක වීම නතර විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අනුව බලාත්මකවීම නතර විය යුතු බවට මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුවද —

(අ) ඒ නියමය සිදුකිරීමට පෙරාතුව නිසියාකාරයෙන් සිදුකරන ලද හෝ මේ පනතේ හෝ යම් නියෝගයක්, රීතියක් හෝ ඒ යටතේ සාදන ලද නියමයකට අනුකූලව අවසර දෙන ලද කිසිවක් ක්‍රියාත්මක කිරීමේ වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය;

(ආ) ඒ නියමය සිදුකිරීමට පෙරාතුව මේ පනතේ විධිවිධාන යටතේ අත්කරගන්නා ලද, උපචිත වූ හෝ දරන ලද අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම් හෝ වගකීම් කිසිවක වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය;

(ඇ) ඒ නියමය සිදුකිරීමට පෙරාතුව මේ පනත යටතේ වූ වැරදි කිසිවක් සම්බන්ධයෙන් පනවන ලද යම් දඩ මුදලක, රාජසන්තක කිරීමක හෝ දඬුවමක වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු අතර, ඒවා නීත්‍යානුකූලව පනවනු ලැබිය හැකි ය ; සහ

(ඈ) ඒ නියමය සිදුකිරීමට පෙරාතුව අයිතිවාසිකම්,වරප්‍රසාද , බැඳීම් හෝ වගකීම් කිසිවක් සම්බන්ධයෙන් වූ යම් විමර්ශනයක්, නීති කෘත්‍යයක් හෝ විසඳුම් කිසිවක

වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු අතර, යම් විමර්ශනයක් හෝ නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යා හැකි අතර, ඒ නියමයෙන් සිදුකර නොමැති ලෙසින් විසඳුම්, වරප්‍රසාද, බැඳීම් හෝ වගකීම් කිසිවක් බලාත්මක කරනු ලැබිය හැකි ය.

II වන කොටස

ජාතික රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ අධිකාරිය පිහිටුවීම

ජාතික රසායනික අවි අධිකාරිය.

**5**. (1) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය ; තව ද ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට එරෙහිව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ සභාපතිවරයා.

**6**. (1) කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අධිකාරියේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු පනත ක්‍රියාත්මක කිරීම භාරව සිටිය යුතු ය.

(2) අධිකාරියට සහාය වීම සඳහා 8 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා විසින් ප්‍රධානත්වය දරන මහලේකම් කාර්යාලයක් තිබිය යුතු ය. මේ පනත යටතේ අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කිරීමේ දී අධිකාරියේ අධ්‍යක්ෂවරයාට සහායවීම සඳහා අවශ්‍ය වන අමාත්‍යාංශයේ යම් නිලධරයන් සංඛ්‍යාවක් ලේකම්වරයා විසින් එම මහලේකම් කාර්යාලයට පත් කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

**7**. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු අතර, එය අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව යෙදීමේ දී, අධිකාරියේ සභාපතිවරයාගේ සහ ඒ මුද්‍රාව යෙදීමේ දී සහතික කිරීමට බලය දෙන ලද අධිකාරියේ වෙනත් යම් නිලධරයකුගේ අත්සනින් ඒ මුද්‍රාව වලංගු බවට සහතික කළ යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව, අධිකාරියේ සභාපතිවරයාගේ සහ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය :

එසේ වුවද සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක දී යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මුද්‍රා තැබීම අවශ්‍ය වන අවස්ථාවක දී තත් කාර්ය සඳහා සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ලැබූ වෙනත් යම් සාමාජිකයකු ඉහත කී උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අත්සන් තැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තැබූ සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

ජාතික රසායනික අවි අධිකාරියේ අධ්‍යක්ෂවරයා පත්කිරීම.

8. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියට අදාළ කටයුතු හෝ සමාන කටයුතු පිළිබඳ සුදුසුකම්ලත් සහ පළපුරුද්ද ඇති තැනැත්තකු රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ස්වකීය සියලුම හෝ යම් බලතල සහ කර්තව්‍ය අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයාට මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සහ එවැනි අනු ප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, අධිකාරියේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි සේවා නියම සහ කොන්දේසිවලට, අධ්‍යක්ෂවරයා යටත් විය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා මහලේකම් කාර්යාලයේ පරිපාලන කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ද වගකිව යුතු ය.

මෙහෙයුම් කමිටුව පත් කිරීම.

9. (1) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව අධිකාරියට උපදෙස් දීම සඳහා ("කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහෙයුම් කමිටුවක් අධිකාරිය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) කමිටුව, අධිකාරිය විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ බහු කාර්ය කටයුතු පිළිබඳ අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(ආ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් රේගු දෙපාර්තමේන්තුවෙන් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(ඇ) ආනයන සහ අපනයන (පාලන) පාලකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන ආනයන සහ අපනයන (පාලන) දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් ;

(ඈ) රජයේ රස පරීක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් ;

(ඉ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා ;

(ඊ) මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙක් ;

(උ) කර්මාන්ත තාක්ෂණ ආයතනයේ රසායනික සහ පාරිසරික තාක්ෂණ අංශයේ අධ්‍යක්ෂවරයා ;

(ඌ) මේ පනතේ උපලේඛනවල නිශ්චිතව දැක්වෙන රසායන ද්‍රව්‍ය පිළිබඳ ඔප්පු කරනු ලැබූ දැනුමක් අත්කරගෙන ඇති විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් ; සහ

(එ) මේ පනතේ උපලේඛනවල නිශ්චිතව දැක්වෙන රසායන වර්ගවලින් යම් රසායන වර්ගයක් නිෂ්පාදනය කිරීමේ, සැකසීමේ සහ පරිභෝජනය කිරීමේ නියැලී සිටින රසායනික කර්මාන්තයේ යෙදී සිටින තැනැත්තෙක්.

(3) කමිටුවේ සාමාජිකයන්ට එක් එක් රැස්වීම සඳහා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

10. (1) කමිටුවේ රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට වරක් පවත්වනු ලැබිය යුතු ය. කමිටුවේ රැස්වීම.

(2) කමිටුවේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය තත් කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් කමිටුව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) ලේකම්වරයා හෝ ඔහු පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන නිලධරයකු කමිටුවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය.

11. අධිකාරියේ කර්තව්‍ය වනුයේ— අධිකාරියේ කර්තව්‍ය.

(අ) සම්මුතියේ විෂය පථය ඇතුළත මේ පනතේ I, II සහ III වන උපලේඛනවල නිශ්චිතව දැක්වෙන විෂ රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් නියාමන තන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම ;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත විශේෂඥයන්ගේ සහ ප්‍රවීනයන්ගේ උපදෙස් හා සේවා ලබා ගැනීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් සම්මුතිය යටතේ වූ වගකීම් ඉටුකිරීම ; සහ

(ඈ) සම්මුතියේ VII ව්‍යවස්ථාව ප්‍රකාරව (මෙහි මින්මතු "ර. අ. ත. ස." යනුවෙන් සඳහන් කරනු ලබන) "රසායනික අවි තහනම් කිරීම සඳහා වූ සංවිධානය" සහ වෙනත් පාර්ශ්ව රාජ්‍යයන් සමග ඵලදායී ලෙස සබඳතා පැවැත්වීම සඳහා ජාතික කේන්ද්‍රීය ස්ථානයක් ලෙස ක්‍රියා කිරීම වේ.

අධිකාරියේ බලතල.

**12.** (1) අධිකාරියේ බලතල වනුයේ—

(අ) (i) මේ පනතේ I, II සහ III වන උපලේඛනවල නිශ්චිතව දැක්වෙන විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ ඒවායේ පූර්වගයන් සහ උපලේඛනගත නොකරන ලද වෙන් වශයෙන් වූ කාබනික රසායනික ද්‍රව්‍ය හෝ ඒවා නිෂ්පාදනය කිරීමට භාවිත කරනු ලබන තැනුම්පොළවල් පාලනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේ සහ අවසර පත්‍ර යෝජනා ක්‍රමයක් පරිපාලනය කිරීමේ ; සහ

(ii) ජාතික ආරක්ෂක වැඩ සටහනක් සෑදීම සඳහා අදාළ අධිකාරීන්ට සහාය වීම සහ ර. අ. ත. ස. යේ වාර්තාව ගැන දැනුවත් කිරීමේ,

අදහසින් වෙනත් අදාළ රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන සමග සම්බන්ධීකරණය කිරීම ;

(ආ) මේ පනතේ විධිවිධාන සහ එය යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ;

(ඇ) සාමාන්‍ය කර්මාන්ත පරීක්ෂා කිරීම්වලට පහසුකම් සැලසීම ;

(ඈ) වෙනත් අදාළ රජයේ අස්ථිත්වයන් සමග එක්ව ක්‍රියා කරමින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ අධිකාරිය වෙත පවරා ඇති කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම ;

(ඉ) මේ පනත යටතේ නියෝග සෑදීමට අදාළ කාරණා පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඊ) අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත පවරන ලද වෙනත් යම් කාර්යයක් ඉටු කිරීම ; සහ

(උ) ඉහත (අ) සිට (ඈ) දක්වා වූ ඡේදවල සඳහන් කර්තව්‍යවලින් යම් කර්තව්‍යයක් ඉටු කිරීමට ආනුශංගික හෝ උපකාරී වන යම් දෙයක් කිරීම වේ.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින්—

(අ) සම්මුතියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම අධීක්ෂණය කිරීම ;

(ආ) මේ පනතේ I, II සහ III, වන උපලේඛනවල නිශ්චිතව දැක්වෙන රසායනික ද්‍රව්‍ය සහ ඒවායේ පූර්වගයන් සෑදීම, නිපදවීම, සැකසුම් කිරීම, පරිභෝජනය කිරීම, මාරු කිරීම, ආනයනය කිරීම, අපනයන කිරීම හෝ භාවිත කිරීම විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම ;

(ඇ) රසායනික අවි භාවිතයට හෝ භාවිතය පිළිබඳ තර්ජනයට එරෙහිව X වන ව්‍යවස්ථාව යටතේ සහය සහ ආරක්ෂාව සඳහා රාජ්‍ය පාර්ශ්වයක් වෙත ඉල්ලීමක් කිරීම හෝ රාජ්‍ය පාර්ශ්වයකින් කරනු ලබන ඉල්ලීමකට අනුග්‍රහය දැක්වීම ;

(ඈ) යුධමය උපක්‍රමයක් වශයෙන් රසායනික අවි හෝ කැරලි කෝලාහල පාලන ද්‍රව්‍යයන් භාවිත කිරීම සම්බන්ධයෙන් චාරික පරීක්ෂා කිරීම් හෝ අභියෝගාත්මක පරීක්ෂා කිරීම් හෝ ඒවා පිළිබඳව විමර්ශනය කිරීම ;

(ඉ) මේ පනතේ කාර්ය සඳහා පරීක්ෂණ සිදු කිරීම ;

(ඊ) අභියෝගාත්මක පරීක්ෂා කිරීම් සඳහා ශ්‍රී ලංකාව විසින් කරනු ලබන ඉල්ලීමක් භාර ගන්නා බවට සහතිකවීමේ අදහසින් ර. අ. ත. ස. සමග ක්‍රියා කිරීම හෝ යම් පාර්ශ්ව රාජ්‍යයක් විසින් ශ්‍රී ලංකාවට එරෙහිව, ර. අ. ත. ස. ට කරනු ලබන යම් නිස්සාර හෝ අපහාසාත්මක ඉල්ලීමකට එරෙහිව ක්‍රියා කිරීම ;

(ඪ) ර. අ. ත. ස. යේ පරීක්ෂකවරුන්ගේ ලැයිස්තුව පරීක්ෂා කොට සෑහීමට පත්වන්නේ නම් එය භාර ගැනීම සහ පරීක්ෂා කිරීමේ භූමියකට පරීක්ෂණ කණ්ඩායමක් විසින් රැගෙන ආ අනුමත උපකරණ සත්‍යායනය කිරීම ;

(ඪඃ) පනත යටතේ අධිකාරිය විසින් රැස් කර ගත් හෝ ලැබුණ රහස්‍ය තොරතුරු සහ තාක්ෂණයේ රහස්‍යභාවය සහතික කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම ;

(එ) සම්මුතියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය යයි විශ්වාස කිරීමට අධිකාරියට සාධාරණ හේතු ඇති තොරතුරු යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටීම ;

(ඒ) 17 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂකවරුන්ට පුහුණුව ලබා දීම ;

(ඔ) විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ ඒවායේ පූර්වගයන් සම්බන්ධයෙන් කටයුතු කරන විද්‍යාගාර අතර විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධිකරණය කිරීම ;

(ඕ) සම්මුතිය යටතේ තහනම් කරනු නොලැබූ කාර්ය සඳහා වූ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, සැකසීම, හෝ භාවිතය සඳහා විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු ජාත්‍යන්තර වශයෙන් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම ;

(ක) සම්මුතිය යටතේ තහනම් කරනු නොලැබූ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් යම් අවස්ථාවක දී නිපදවිය හැකි අත්කරගත හැකි, තබාගත හැකි, මාරු කළ හැකි හෝ භාවිත කළ හැකි වූද මේ පනතේ I, II, සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති යම් රසායනික ද්‍රව්‍යයක හෝ ඒවායේ පූර්වගයන්ගේ ප්‍රමාණය කලින් කල තීරණය කිරීම ; සහ

(ග) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍ය ඉටු කිරීම.

(3) මේ පනත යටතේ සිය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ දී අධිකාරිය, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට යටත් විය යුතු ය.

**13**. මේ පනතේ I, II සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ පූර්වගයන් සම්බන්ධයෙන් වූ ආරම්භක, වාර්ෂික සහ කලින් කළ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශ හෝ සම්මුතිය යටතේ සෑදීමට නියමිත වෙනත් යම් ප්‍රකාශ අධිකාරිය විසින් පිළියෙල කළ යුතු අතර, එවැනි ප්‍රකාශ සම්මුතිය යටතේ නිශ්චිතව දැක්වනු ලැබිය හැකි කාලයක දී හෝ කාල සීමාවන්වල දී ර. අ. ත. ස. ය වෙත යවනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් ර. අ. ත. ස වෙත ප්‍රකාශ ඉදිරිපත් කල යුතු බව.

**14**. මේ පනතේ I, II සහ III වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති විෂ සහිත රසායනික ද්‍රව්‍ය පිළිබඳ සහ අමාත්‍යවරයා විසින් උචිත යයි සළකනු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් වූ සාමාන්‍ය ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත විධාන කරනු ලැබිය හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය වන්නේ ය :

අමාත්‍යවරයා විසින් විධාන කිරීම.

එසේ වුව ද, වෙනත් යම් අමාත්‍යවරයකුට පවරා ඇති විෂය හෝ කර්තව්‍යවලට බලපාන යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ විධාන නිකුත් කිරීමේ දී ඒ අමාත්‍යවරයා විමසා ක්‍රියා කල යුතු ය.

**15**. අධිකාරියේ මෙහෙයුම් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි යම් තොරතුරු අධිකාරිය විසින් ඒ අමාත්‍යවරයා වෙත ලබා දිය යුතු ය.

අධිකාරිය විසින් අමාත්‍යවරයාට තොරතුරු ලබාදිය යුතු බව.

**16**. (1) තත් කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක අන්තර්ගතව කුමක් සඳහන් වුව ද, මේ පනතේ I, II සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති රසායනික ද්‍රව්‍ය හෝ පූර්වගයන් සහ උපලේඛනගත නොකල වෙනත් වෙන් වශයෙන් වූ කාබනික රසායන ද්‍රව්‍ය, රසායනික අවි, රසායනික අවි නිෂ්පාදන තැනුම්පොළ සහ කැරලි කෝලාහල පාලන ද්‍රව්‍ය යන කරුණුවලට අදාළ තොරතුරු, ප්‍රකාශ හෝ වාර්තා ද අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තරද කලින් කල හෝ නියම කරනු ලැබූ විට ඉදිරිපත් කරන ලෙස අධිකාරිය විසින් සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් යම් ආනයනකරුවකුගෙන්, අපනයනකරුවකුගෙන්, සැපයුම්කරුවකුගෙන්, රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් හෝ සංවිධානයකින් හෝ තැනැත්තකුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

තොරතුරු ආදිය ඉල්ලා සිටීමට අධිකාරිය සතු බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයකට අනුකූලව ක්‍රියා කරන විට කිසි ම තැනැත්තකු, ආයතනයක් හෝ

සංවිධානයක් විසින් යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් සාවද්‍ය හෝ අසත්‍ය බවට තමා දන්නා හෝ නැතහොත් සාවද්‍ය හෝ අසත්‍ය බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති යම් තොරතුරක් ලබාදීම හෝ යම් ප්‍රකාශනයක්, වාර්තාවක් හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ නොකල යුතු ය.

පරීක්ෂකවරයා පත්කිරීම.

**17**. (1) අධිකාරිය විසින් මේ පනතේ කාර්ය සඳහා පරීක්ෂකවරයකු වශයෙන් අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් කලින් කල පරීක්ෂකවරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් රජයේ නිලධරයකු ලිඛිතව පත් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරිය විසින් (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පත් කරනු ලැබූ සෑම පරීක්ෂකවරයකුටම, පරීක්ෂකවරයකු ලෙස පත් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. එම සහතිකය මේ පනත යටතේ සාදන ලද රීති මගින් විධිවිධාන සලසා ඇති පරිදි වූ ආකෘති පත්‍රයක් අනුව විය යුතු අතර, යම් ආයතනයකදී ඉල්ලා සිටිනු ලැබුවහොත්, පරීක්ෂකවරයා විසින් එම සහතිකය එම ආයතනයේ පදිංචිකරුට හෝ එහි වගකිව යුතු කළමනාකරණ තනතුරක් දරන තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පරීක්ෂකවරයාගේ බලතල.

**18**. (1) තත් කාර්ය සඳහා සාදන ලද යම් රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා පරීක්ෂකවරයකුට පහත දැක්වෙන ක්‍රියා සියල්ලම හෝ ඉන් යම් ක්‍රියාවක් කිරීමට බලය ඇත්තේ ය :—

(අ) මේ සඳහා දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ සියලු සාධාරණ වේලාවන් තුළ දී, යම් පරිශ්‍රයකට හෝ තැනුම් පොළක ට ඇතුලු වී පරීක්ෂා කිරීම ;

(ආ) යම් පරිශ්‍රයක හෝ තැනුම් පොළක ඇති යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් පරීක්ෂා කිරීම හෝ විභාග කිරීම ;

(ඇ) යම් පරිශ්‍රයක හෝ තැනුම් පොළක ඇති යම් ද්‍රව්‍යයක හෝ දෙයක නියැදි ලබා ගැනීම ;

(ඈ) යම් පරිශ්‍රයක හෝ තැනුම් පොළක ඇති යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් මැනීම ;

(ඉ) මේ පනතේ නියමයන්ට, ඒ යටතේ සාදන ලද නියෝගවලට හෝ අවසර පත්‍රයක ඇතුලත් කොන්දේසිවලට අනුකූලව තබන ලද වාර්තාවක් ඇතුලු ලේඛනයක් පරීක්ෂා කිරීම ;

(ඊ) (ඉ) (ඡේදයේ සඳහන් වර්ගයක වාර්තාවක් ඇතුලුව) ලේඛනයක උධෘත හෝ පිටපත් සෑදීම හෝ යම් ක්‍රමයකින් යම් ද්‍රව්‍යයක හෝ දෙයක පිළිබිඹු සෑදීම ;

(උ) අලාභ හානි සිදු කිරීමකින් තොරව, උපකරණය ක්‍රියාත්මක කළ හැකි බව සාධාරණ හේතු මත පරීක්ෂකවරයා විශ්වාස කරන්නේ නම්, පරිශ්‍රයේ හෝ තැනුම්පොළේ පිහිටි ඉලෙක්ට්‍රොනික උපකරණ ඇතුලු යම් උපකරණයක් ක්‍රියාත්මක කිරීම ;

(ඌ) ඉහත ඡේදවලින් යම් ඡේදයක් යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන යම් උපකරණයක් හෝ ද්‍රව්‍යයක් පරිශ්‍රයක් හෝ තැනුම්පොළ ඇතුළට ගෙන යාම ;

(එ) වැඩහුම්යක සේවය කරන තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීම ; සහ

(ඒ) පරීක්ෂා කිරීමක් සිදු කිරීම සඳහා අවශ්‍ය හෝ පහසුවන යම් දෙයක් හෝ ක්‍රියාවක් ඉටු කිරීම.

(2) (1) වන උපවගන්තියේ බලතලවලට අමතරව මේ පනත යටතේ වූ යම් වරදක් සිදුකිරීමකට අදාලව සාධාරණ හේතු මත සාක්ෂිමය ද්‍රව්‍ය බවට පරීක්ෂකවරයා විශ්වාස කරන යම් ද්‍රව්‍යයක් තහනමට ගෙන රඳවා තබා ගැනීමේ බලයද පරීක්ෂකවරයකු සම්බන්ධයෙන් වූ පරීක්ෂණ බලතලවලට කරන ලද සඳහනකට ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), සහ (උ) යන ඡේදවල සඳහන් බලතල :—

(අ) අධිකාරියේ සභාපතිවරයාගේ හෝ අධ්‍යක්ෂවරයාගේ අනුමතිය ඇතිව පමණක් ; සහ

(ආ) පරිශ්‍රයට හෝ තැනුම්පොළට අදාළ යම් ආරක්ෂක කාර්ය පටිපාටියකට අනුකූලව,

පරීක්ෂකවරයකු විසින් 25 වන වගන්තියේ (1) උපවගන්තියේ (අ) ඡේදය යටතේ, සාධාරණ හේතු මත ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) යම් පරිශ්‍රයක හෝ තැනුම්පොළක අයිතිකරු හෝ පදිංචිකරු, ඔහුගේ නියෝජිතයන් සහ සේවකයන් විසින්, සියලු අවස්ථාවන්හි දී (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා පරීක්ෂකවරයකුට අවශ්‍ය ක්‍රම සහ පහසුකම් ලබාදිය යුතු ය.

III වන කොටස

## රසායනික අවි සහ විෂ සහිත රසායනික ද්‍රව්‍ය තහනම් කිරීම සහ පාලනය කිරීම

රසායනික අවි නිෂ්පාදනය කිරීම, සෑදීම, අත්කර ගැනීම ආදිය තහනම් කිරීම.

**19**. (1) (අ) රසායනික අවියක් භාවිත කරන :—

(ආ) රසායනික අවියක් නිෂ්පාදනය කරන හෝ සාදන ;

(ඇ) රසායනික අවියක් අත්කර ගන්නා, රැස් කරන හෝ තබාගෙන සිටින ;

(ඈ) යම් රසායනික අවියක්, කෙලින්ම හෝ අන්‍යාකාරයකින් වෙනත් තැනැත්තකුට පවරන ;

(ඉ) රසායනික අවියක් භාවිත කිරීම සඳහා යම් යුධ සූදානමක නියැලෙන ;

(ඊ) දැන දැනම යම් තහනම් ක්‍රියාවකට ආධාර දෙන, අනුබල දෙන හෝ ඊට පොළඹවන ; හෝ

(උ) යම් කැරලි, කලකෝලහල පාලන ද්‍රව්‍යයක් යුධ උපක්‍රමයක් ලෙස භාවිත කරන,

යම් තැනැත්තෙක් මේ වගන්තිය යටතේ වරදකට වරදකරුවන අතර, ඔහුට අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් දස ලක්ෂයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ අධිකාරි බලය යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝගයක් යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ රසායනික අවි විනාශ කරනතුරු 17 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂකවරයකු විසින් හෝ ජාත්‍යන්තර පරීක්ෂකයකු විසින් එම රසායනික අවි තබා ගැනීම හෝ සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ අන්තර්ගත තහනම අදාළ නොවිය යුතු ය.

(3) යම් ද්‍රව්‍යයකට අදාළව (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) හෝ (උ) ඡේද යටතේ යම් වරදක් සඳහා වූ නඩු කටයුතුවලදී—

(අ) අවස්ථාවෝචිත පරිදි එම ද්‍රව්‍යය, රසායන අවියක් හෝ කැරලිකෝලාහල පාලන ද්‍රව්‍යයක් බව තමා දැන නොසිටි බවත්, නැතහොත් සැක නොකල බවත්, හෝ සැක කිරීමට හේතු නොතිබුණ බවත්, විත්තිකරු විසින් ඔප්පු කිරීම ; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි එම ද්‍රව්‍යය රසායනික අවියක් හෝ කැරලිකෝලහල පාලන ද්‍රව්‍යයක් බවට තමා පළමුවෙන් දැනගැනීමෙන් පසු හෝ සැක කිරීමෙන් පසු ප්‍රයෝගිකව හැකිතාක් ඉක්මනින් ඔහුගේ දැනුම හෝ සැකය පිළිබඳව බලයලත් නිලධරයකුට දැනුම්දීමට සියලු සාධාරන පියවර ඔහු විසින් ගනු ලැබූ බවත්, චූදිතයා විසින් ඔප්පු කිරීම,

චූදිතයා සඳහා වූ විත්තිවාචකයක් වන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ වූ වරදකට චෝදනා ලැබ සිටින තැනැත්තකුට මතු කිරීම සඳහා විවෘතව ඇති යම් විත්ති වාචකයකට (3) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් හානියක් සිදු නොවිය යුතු ය.

විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ ඒවායේ පූර්වගයන් සෑදීම, නිෂ්පාදනය අත්කර ගැනීම ආදිය තහනම් බව.

**20**. (1) කිසිම තැනැත්තකු විසින්—

(අ) රාජ්‍ය පාර්ශ්වයන්ගේ භූමි ප්‍රදේශයෙන් පිටත මේ පනතේ I වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති විෂ සහිත රසායන ද්‍රව්‍යයක් හෝ එහි පූර්වගයන් සෑදීම, නිපදවීම, අත්කර ගැනීම, තබා ගැනීම හෝ භාවිත කිරීම නොකල යුතු අතර, වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට හැර ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් පිටතට එවැනි රසායනික ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් මාරුකිරීම නොකළ යුතු ය ;

(ආ) (i) මේ පනතේ I වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති විෂ සහිත රසායන ද්‍රව්‍යය හෝ පූර්වගයන් පර්යේෂණ, වෛද්‍ය, ඖෂධීය හෝ ආරක්ෂක කාර්ය සඳහා භාවිතා කරන්නේ නම් මිස ; සහ

(ii) විෂ සහිත රසායන ද්‍රවය හෝ පූර්වගයන් වර්ග (1) වන අනුඡේදයේ නිශ්චිතව දැක්වෙන කාර්යවලට අදාළව

සාධාරණීකරණය කළ හැකි වර්ගවලට තදින්ම සීමාවන්නේ නම් මිස, සහ යම් අවස්ථාවක දී එම කාර්ය සඳහා වූ එම විෂ සහිත රසායනික ද්‍රව්‍යවල හෝ පූර්වගයන්ගේ ප්‍රමාණය අධිකාරිය විසින් නිශ්චය කර ඇති සීමාවන් නොඉක්මවන්නේ නම් මිස,

කිසි තැනැත්තකු විසින් අධිකාරියේ අවසරය නොලබා මේ පනතේ I වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති යම් විෂ සහිත රසායන ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් නිපදවීම, අත්කර ගැනීම, තබා ගැනීම, මාරු කිරීම හෝ භාවිත කිරීම ;

(ඇ) (i) (ආ) ඡේදයේ (i) අනුඡේදයේ නිශ්චිතව දැක්වෙන කාර්ය සඳහා හැර ; සහ

(ii) සම්මුතියේ සත්‍යායන ඇමුණුමේ VI කොටසේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව මිස,

ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට මේ පනතේ I වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ පූර්වගයන් මාරු කිරීම :

එසේ වුවද මේ ඡේදයේ සඳහන් කරනු ලැබූ විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ පූර්වගයන් තෙවන රාජ්‍යයකට නැවත මාරු කිරීමක් නොකළ යුතු ය.

(ඈ) මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විෂ සහිත රසායන ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් සම්මුතියේ පාර්ශ්වකරුවකු නොවන රාජ්‍යයක යම් අස්ථිත්වයකට මාරු කිරීම හෝ එවැනි අස්ථිත්වයක සිට මාරු කිරීම,

නොකළ යුතු ය.

(235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතට අනුකූලව අපනයනය කිරීම හෝ ආනයනය කිරීම කළ යුතු බව.

**21**. (1) (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව මිස, කිසිම තැනැත්තකු විසින් මේ පනතේ I, II, සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති යම් රසායනික ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම නොකල යුතු ය.

(2) මේ පනතේ, I, II, සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති යම් රසායනික ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සඳහා වූ අවසර පත්‍රයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ආනයන සහ අපනයන පාලකවරයා වෙත කරනු ලබන අවස්ථාවක දී ඔහු විසින් කොන්දේසි සහිතව හෝ රහිතව අවශ්‍ය විය හැකි අනුමතය සඳහා අධිකාරිය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

**22**. උපලේඛනගත රසායනික ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනය කිරීමේ උත්සාහයක් සිදුවුවහොත්, එම රසායනික ද්‍රව්‍ය ලංකාවට නීති විරෝධී ලෙස ආනයනය කරන ලද තහනම් ආනයන භාණ්ඩයක් ලෙස සළකා එම රසායනික ද්‍රව්‍ය (235 වන අධිකාරය වූ ) රේගු ආඥා පනත යටතේ තහනමට ගෙන රාජ සන්තක කරනු ලැබීමට යටත් වන්නේ ය. තහනමට ගැනීම සහ රාජසන්තක කිරීම.

**23**. වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ වැරදි පිළිබඳව අසා විභාග කොට දඬුවම් පැමිණවීම සඳහා කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව මගින් පිහිටුවා කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයට අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ය. මේ පනත යටතේ වූ වැරදි මහාධිකරණය විසින් විභාග කල යුතු බව.

## IV වන කොටස

## නිපදවන්නන්, භාවිත කරන්නන් ආදී වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම

**24**. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමෙන් පසු මේ පනතේ I, II සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති යම් විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් නිපදවීමට, සකස් කිරීමට, අත්කර ගැනීමට පරිභෝජනය කිරීමට, මාරු කිරීමට, ආනයනය කිරීමට අපනයනය කිරීමට හෝ භාවිත කිරීමට අදහස් කරන නැතහොත් උපලේඛනගත නොකරන ලද වෙන් වශයෙන් වූ කාබනික රසායන ද්‍රව්‍යයක් නිපදවීමට අදහස් කරන යම් තැනැත්තෙක් අවස්ථාවෝචිත පරිදි නිෂ්පාදකයකු, සකස්කරන්නකු, අත්කරගන්නකු, පාරිභෝගිකයකු, මාරු කරන්නකු, ආනයනය කරන්නකු, අපනයනය කරන්නකු හෝ භාවිත කරන්නකු වශයෙන් නැතහොත් උපලේඛනගත නොකරන ලද වෙන් වශයෙන් වූ කාබනික රසායන ද්‍රව්‍ය නිෂ්පාදකයකු වශයෙන් තමාගේ නම ලියාපදිංචි කිරීම සඳහා අධිකාරිය වෙත එම තැනැත්තා ඉල්ලීමක් කර ඇත්නම් මිස, ඔහු විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ නොකල යුතු ය. යම් විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් හෝ පූර්වගයන් නිෂ්පාදනය කිරීම ආදියෙහි නියැලී සිටින තැනැත්තන් ලියාපදිංචි කිරීම.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ I, II සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති යම් විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් වැඩි දියුණු කිරීමේ, නිපදවීමේ සකස් කිරීමේ අත්කර ගැනීමේ, පරිභෝජනය කිරීමේ, මාරු කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ හෝ භාවිත කිරීමේ නියැලී සිටින නැතහොත් උපලේඛනගත කරනු නොලැබූ යම් වෙන්ව පවත්නා

කාබනික රසායන ද්‍රව්‍යයක් නිපදවීමේ නියැලී සිටින සෑම තැනැත්තෙක් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දින සිට දින තිහක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි වැඩි දියුණු කරන්නෙකු, නිපදවන්නෙකු, සකස් කරන්නකු, අත්කරගන්නකු, පාරිභෝගිකයකු, මාරු කරන්නකු, ආනයනය කරන්නකු, අපනයනය කරන්නකු හෝ භාවිත කරන්නකු නැතහොත් උපලේඛනගත නොකරන ලද වෙන්ව පවත්නා කාබනික රසායන ද්‍රව්‍යයක් නිපදවන්නකු වශයෙන් තමාගේ නම ලියාපදිංචි කිරීම සඳහා අධිකාරිය වෙත ඉල්ලීමක් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමෙහි ආකෘතිය, එම ඉල්ලුම් පත්‍රයේ අන්තර්ගතවිය යුතු කරුණු, එම ඉල්ලීම ඉදිරිපත් කල යුතු ආකාරය, එම ඉල්ලීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තුව, ලියාපදිංචි කිරීමේ සහතිකයේ ආකෘතිය සහ ලියාපදිංචිවීමේ සහතිකයක් ප්‍රදානය කිරීමේ දී හෝ අවලංගු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් ලැබීමේදී, ඉල්ලීම නියමිත ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කර ඇත්නම්, අධිකාරිය විසින් ඉල්ලුම්කරුගේ නම ලියාපදිංචි කර ඔහුට ලියාපදිංචි කිරීමේ සහතිකයක් ප්‍රදානය කල යුතු ය.

(5) මේ වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් එහි සඳහන් කාලය සඳහා වලංගු විය යුතු අතර, එය නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් ගෙවීමෙන් පසු, නියම කරනු ලැබිය හැකි වැඩිදුර කාල සීමාවක් සඳහා කලින් කල අළුත් කරනු ලැබිය හැකි ය.

තොරතුරු සැපයීම සහ වාර්තාව.

**25**. (1) මේ පනතේ I, II, සහ III උපලේඛනවල දක්වා ඇති යම් විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් හෝ ඒවායේ පූර්වගයක් වැඩි දියුණු කිරීමේ, නිපදවීමේ, සැකසුම් කිරීමේ, අත්කර ගැනීමේ, පරිභෝජනය කිරීමේ, මාරු කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ හෝ භාවිතා කිරීමේ නියැලී සිටින හෝ උපලේඛනගත නොකරන ලද වෙන් වශයෙන් වූ කාබනික රසායනික ද්‍රව්‍යයක් නිපදවීමේ සහ 24 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අධිකාරය සමඟ ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු විසින් –

(අ) (i) අවස්ථාවෝචිත පරිදි රසායනික ද්‍රව්‍ය සහ තැනුම් පොළට අදාළව ;

(ii) රසායනික ද්‍රව්‍යය භාවිත කරන කාර්යවලට අදාළව ; සහ

(iii) ර. අ. ත. ස. වෙත සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කිරීමට නියමිත ප්‍රකාශය සඳහා අදාළ කරුණු සම්බන්ධයෙන්,

නියම කරනු ලබන විස්තර, නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රවල සහ නියම කරනු ලබන කාල සීමාවන් තුළදී අධිකාරිය වෙත යවනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් රසායනික ද්‍රව්‍ය සහ තැනුම් පොළට අදාළව මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලබන වාර්තා තැබිය යුතු ය ; සහ

(ඇ) (අ) ඡේදයේ සඳහන් රසායනික ද්‍රව්‍ය සහ තැනුම් පොළට අදාළව මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලබන වාර්තා, නියත කාලීන වාර්තා සහ විශේෂ වාර්තා පිළියෙල කොට අධිකාරිය වෙත ලබා දිය යුතු ය.

(2) සාධාරණ හේතුවක් නොමැතිව (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන නැතහොත් අසත්‍ය හෝ නොමග යවන සුළු වාර්තා හෝ සටහන් පිළියෙල කරන, තබා ගන්නා හෝ යවන යම් තැනැත්තෙක් මේ වගන්තිය යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පහත සඳහන් කරුණුවලට අදාළව නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) එම වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතවිය යුතු කරුණු ;

(ආ) එම වාර්තා තබාගත යුතු කාල සීමාව ;

(ඇ) ඉදිරිපත් කල යුතු නියත කාලීන වාර්තාවල ආකෘතිය සහ ඒවායේ අන්තර්ගත විය යුතු කරුණු ;

(ඈ) විශේෂ වාර්තා අවශ්‍ය වන අවස්ථා සහ එම විශේෂ වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගත විය යුතු කරුණු ;

(ඉ) එවැනි නියත කාලීන වාර්තා සහ විශේෂ වාර්තා සෑදිය යුතු කාල සීමාව ; සහ

(ඊ) එවැනි නියත කාලීන වාර්තා සහ විශේෂ වාර්තා අත්සන් කල යුතු තැනැත්තන්.

## V වන කොටස

## පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම සහ රාජසන්තක කිරීම.

පරීක්ෂා කිරීම්.

**26**. (1) 17 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පරීක්ෂකවරයකු—

(අ) යම් පරිශ්‍රයක පාලනය භාරව සිටින තැනැත්තාගේ කැමැත්ත ඇතිව ; හෝ

(ආ) යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් 35 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් යටතේ,

පරිශ්‍රයකට ඇතුළු වී—

(i) මේ පනතේ I, II සහ III වන උපලේඛනවල ලැයිස්තුගත කර ඇති යම් විෂ සහිත රසායන ද්‍රව්‍යයක් හෝ පූර්වගයක් නිෂ්පාදනය කිරීමේ, සැකසුම් කිරීමේ, අත්කර ගැනීමේ, පරිභෝජනය කිරීමේ, මාරු කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ හෝ භාවිත කිරීමේ නියැලී සිටින යම් තැනැත්තෙක් ; හෝ උපලේඛනගත නොකරන ලද වෙන් වශයෙන් වූ කාබනික රසායන ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ නියැලී සිටින යම් තැනැත්තෙක් ;

(ii) සම්මුතියේ සත්‍යායන ඇමුණුමේ නිශ්චිතව දැක්වෙන කාර්ය සඳහා යම් රසායනික අවියක් තබා ඇති ස්ථානයක් හෝ යම් රසායනික අවි නිෂ්පාදන තැනුම්පොළ ඇති ස්ථානයක්,

පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ සභාපතිවරයා විසින් ලිඛිතව පවරනු ලැබූ සෑම පරීක්ෂකවරයකුටම සහ පරීක්ෂණ කණ්ඩායමකටම—

(අ) අදාළ කරුණු ස්ථිර කර ගැනීමේ කාර්ය සඳහා යම් තැනුම්පොළකට අදාළ පුද්ගලයන් සමග සාකච්ඡා කිරීමේ අයිතිය ;

(ආ) පරීක්ෂණය අතරතුරදී පැන නැගිය හැකි අපැහැදිලි කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමේ අයිතිය ;

(ඈ) පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා අදාළ සහ අවශ්‍ය ලේඛන සහ වාර්තා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය ;

(ඇ) පරීක්ෂණ භූමියක පිහිටි යම් ද්‍රව්‍යයක් හෝ ගොඩනැගිල්ලකට අදාළ ප්‍රශ්නයක් නොවිසඳුනහොත් එම ද්‍රව්‍යය හෝ ගොඩනැගිල්ලේ ඡායාරූප ගැනීමේ අයිතිය ;

(ඉ) නියැදි ලබා ගැනීමේ අයිතිය සහ එම නියැදි පිළිබඳ අදාළ ස්ථානයේදීම විශ්ලේෂණ කිරීමේ අයිතිය ; සහ

(ඊ) සම්මුතිය යටතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් අයිතීන්,

තිබිය යුතු ය.

(3) සහතික කිරීමේ කටයුතු පවත්වන අතරතුර දී පරීක්ෂකවරයකු හෝ පරීක්ෂණ කණ්ඩායමක් විසින් සම්මුතියේ සත්‍යායන ඇමුණුමේ II කොටසේ සඳහන් වරප්‍රසාද සහ මුක්තයන් භුක්තිවිඳිය යුතු ය.

**27**. පාලනය භාරව සිටින තැනැත්තාගේ කැමැත්ත ඇතිව පරිශ්‍රය සම්බන්ධයෙන් 35 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් යටතේ, පරීක්ෂකවරයකුට— ජාත්‍යන්තර පරීක්ෂා කිරීම්.

(අ) සම්මුතියේ සත්‍යායන ඇමුණුමේ VI වන කොටසේ සිට IX වන කොටස දක්වා වූ යම් විධිවිධානයක් අදාළ වන්නේ යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් ද ; හෝ

(ආ) සම්මුතියේ IX වන ව්‍යවස්ථාවේ 8 වන ඡේදයේ සඳහන් ස්ථානයික අභියෝගාත්මක පරීක්ෂණයකට යටත්ව ඇති ; හෝ

(ඇ) සම්මුතියේ X වන ව්‍යවස්ථාවේ 9 වන ඡේදය යටතේ විමර්ශනයක් ආරම්භ කර ඇත්තේ යම් පරිශ්‍රයක්, සම්බන්ධයෙන් ද—

(i) එම පරිශ්‍රයට ඇතුලු වී—

(ii) සම්මුතිය ප්‍රකාරව පරිශ්‍රය සහ තැනුම් පොළක් සම්බන්ධයෙන් වන විට යම් අදාළ තැනුම්පොළ ගිවිසුමක් ප්‍රකාරව පරීක්ෂා කිරීම ; සහ

(iii) පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් සහ යම් තැනුම් පොළක් සම්බන්ධයෙන් වන විට අදාළ තැනුම් පොළ ගිවිසුම අදහස් කරන ලද යම් කර්තව්‍යයක් සහ සම්මුතියේ විධිවිධාන මගින් සළසා ඇති බලතල ක්‍රියාත්මක කිරීම,

පරීක්ෂකවරයකුට කල හැකි ය.

ජාත්‍යන්තර පරීක්ෂකවරයන් සමග සිටිය යුතු තැනැත්තන්.

**28**. (1) ජාත්‍යන්තර පරීක්ෂකවරයකු විසින් සිදු කරනු ලබන පරීක්ෂා කිරීමකට පහසුකම් සැළසීමේ කාර්ය සඳහා-

(අ) නිරීක්ෂකයෙක් ; හෝ

(ආ) පරීක්ෂකවරයකු,

යන ඉහත සඳහන් නිලධරයන් දෙදෙනාගෙන් එක් අයකු හෝ ඒ දෙදෙනාම හෝ, ඔහු සමග සිටිය යුතු ය.

(2) 18 වන වගන්තියේ සඳහන් පරීක්ෂා කිරීමක් පහසු කිරීමේ කාර්ය සඳහා පරීක්ෂකවරයකු විසින් යම් පරීක්ෂණ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ "නිරීක්ෂකයා" යන්නෙන් සම්මුතියේ IX ව්‍යවස්ථාවේ 12 වන ඡේදයේ සඳහන් නිරීක්ෂකයකු අදහස් වන අතර, ඊට පරීක්ෂා කිරීමක් නිරීක්ෂණය කිරීමට බලය පවරා ඇති යම් තැනැත්තකු ද ඇතුළත් වේ.

හඳුනාගැනීමේ සහතිකය.

**29**. අධිකාරිය විසින් සෑම පරීක්ෂකවරයකුට සහ ජාත්‍යන්තර පරීක්ෂකවරයකුට අවස්ථාවෝචිත පරිදි පරීක්ෂකවරයකු හෝ ජාත්‍යන්තර පරීක්ෂකවරයකු වශයෙන් ඔහු හඳුන්වාදෙමින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

ඇතැම් ක්‍රියාවලින් වැරදි සංයුක්ත වන බව.

**30**. සාධාරණ හේතුවක් නොමැතිව සිතාමතාම—

(අ) සම්මුතියේ සත්‍යායන ඇමුණුමට අනුකූලව පරීක්ෂණයක් පැවැත්වීමට පහසුකම් සැළසීමේ කාර්ය සඳහා පරීක්ෂකවරයකු විසින් හෝ පරීක්ෂණ කණ්ඩායමක් විසින් කරනු ලබන ඉල්ලීමක්, ප්‍රතික්ෂේප කරන ;

(ආ) පරීක්ෂණ කණ්ඩායමක යම් සාමාජිකයකු, පරීක්ෂකයකු හෝ නිරීක්ෂකයකු පරීක්ෂා කිරීමක් සිදු කිරීමේ යෙදී සිටින විට, ප්‍රමාද කරන නැතහොත් බාධා කරන ; හෝ

(ඇ) පරීක්ෂකයකු හෝ පරීක්ෂණ කණ්ඩායමක් විසින් සවිකර ඇති ස්ථානයික මෙවලමක හෝ අනුමත උපකරණයක ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස හානි කිරීමේ අදහසින් එම මෙවලම හෝ උපකරණය සිතාමතාම ඉවක් කරන හෝ ඊට යම් අනිසි ක්‍රියාවක් කරන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**31**. (1) රසායනික ද්‍රව්‍යයක නියැදියක් ලැබීමේදී පරීක්ෂණ කණ්ඩායමක් විසින් එම නියැදිය බලයලත් විශ්ලේෂකයකු ලවා විශ්ලේෂණය කරවීමට තමාට හෝ එම කණ්ඩායමට ඇති අදහස පිළිබඳව එම පරිශ්‍රය භාරව සිටින තැනැත්තාට වහාම දැනුම් දිය යුතු අතර, වහාම නියැදිය සමාන කොටස් දෙකකට බෙදා එක් එක් කොටස එම නියැදියේ ස්වභාවය අනුව පහසු පරිදි ලකුණු කොට මුද්‍රා තබා එක් කොටසක් පරිශ්‍රය භාර තැනැත්තාටද අනික් කොටස බලයලත් විශ්ලේෂකවරයාටද භාර දිය යුතු ය. නියැදි විශ්ලේෂණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද රසායන ද්‍රව්‍යයක් බලයලත් විශ්ලේෂකයකු විසින් විශ්ලේෂණය කරනු ලැබූ හෝ පරීක්ෂා කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් තම පරීක්ෂණයේ හෝ විශ්ලේෂණයේ ප්‍රතිඵල සහතිකයේ හෝ වාර්තාවේ සඳහන් කරමින් අධිකාරිය වෙත සහතිකයක් හෝ වාර්තාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී මේ වගන්තිය යටතේ විශ්ලේෂණය සඳහා ලබාගත් යම් නියැදියක් සම්බන්ධයෙන් බලයලත් විශ්ලේෂකවරයා විසින් අත්සන් කරන ලද සහතිකයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීම එම වාර්තාවේ සඳහන් සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

## VI වන කොටස

## පරිපූරක

**32**. මේ පනත හෝ එය යටතේ සාදන ලද නියෝගයක් බලාත්මක කිරීමේ සහ මේ පනත මගින් ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇත්තේ හෝ සීමා කර ඇත්තේ යම් රසායනික ද්‍රව්‍යයක් (**235** වන අධිකාරය වූ) රේගු ආඥා පනත අදාළවීම.

සම්බන්ධයෙන් ද එම රසායනික ද්‍රව්‍යයට අදාලව මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට උත්සහ කිරීම වැළැක්වීම සඳහා සහ ඒ සඳහා දඬුවම්දීම සඳහා (235 වන අධිකාරය වූ )රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු අතර, එම රසායනික ද්‍රව්‍යය රේගු ආඥා පනතේ 'ආ' උපලේඛනයේ රටතුළට ගෙනඒම තහනම්කර ඇති සහ සීමා කර ඇති භාණ්ඩ පිළිබඳ වගුවෙහි ඇතුලත් කර ඇති ලෙස සළකනු ලැබිය යුතු ය. මේ පනත මගින් අපනයනය කිරීම තහනම්කර ඇති හෝ සීමා කර ඇති රසායනික ද්‍රව්‍යය එම උපලේඛනයෙහි පිට ගෙනයාම තහනම්කර සහ සීමාකර ඇති වගුවෙහි ඇතුලත් කර ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

සාවද්‍ය ප්‍රකාශවලට එරෙහි තහනම.

**33**. කිසිම තැනැත්තකු තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන්—

(අ) මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, අධිකාරී බලයක්, බලය පැවරීමක්, හෝ සහතිකයක් නිකුත් කිරීමේ, ප්‍රදානය කිරීමේ, භාරදීමේ, වෙනස් කිරීමේ හෝ අලුත් කිරීමේ කාර්ය සඳහා ; හෝ

(ආ) රසායනික ද්‍රව්‍ය ආනයනකරුවකු ලෙස, අපනයනකරුවකු ලෙස සහ වෙළෙන්දකු ලෙස ලියාපදිංචිවීමේ කාර්ය සඳහා,

යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය වන වාචික හෝ ලිඛිත යම් ප්‍රකාශයක් හෝ කටඋත්තරයක් නොකල යුතු අතර නැතහොත් දැන දැනම එම අසත්‍ය ප්‍රකාශ අඩංගු කටඋත්තරයක් හෝ ප්‍රකාශයක් හෝ යම් ලේඛනයක් ලබාදීම හෝ ඉදිරිපත් කිරීම හෝ භාවිත කිරීම නොකල යුතු ය.

අනුමතය ප්‍රදානය කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම සහ ගාස්තු පැනවීම.

**34**. (1) මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ අනුමතය ප්‍රදානය කිරීමට යම් තැනැත්තකුට බලය ඇති අවස්ථාවක, ඔහු විසින් ඔහුගේ අභිමතය පරිදි—

(අ) ඔහු විසින් සුදුසු යයි සළකනු ලබන කොන්දේසි එහි ඇතුළත් කරනු ලැබිය හැකි ය ;

(ආ) අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත් අවලංගු කරනු ලැබිය හැකි ය;

(2) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම තීරණයක්ම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයකට යටත් වේ.

(3) මේ වගන්තිය බලපත්‍රයකට අදාළවන ආකාරයකටම අවසර පත්‍රයකට, අධිකාරී බලයකට, බලය පැවරීමකට හෝ සහතිකයකටද අදාළ වන අතර, මෙම වගන්තිය පුද්ගලයකුට අදාළ වන ආකාරයකටම යම් අස්ථිත්වයකටද අදාළ වේ.

**35**. (1) මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් යම් ස්ථානයක හෝ පරිශ්‍රයක යම් දෙයක් තබා ඇති බවට සන්තකයේ රඳවාගෙන ඇති බවට, විකුණනු ලබන බවට හෝ නිපදවනු ලබන බවට නැතහොත් මේ පනත යටතේ වරදක් වන යම් ගණුදෙනුවකට හෝ වෙළෙඳාමකට නැතහොත් සිදු කරනු ලැබුවහොත් මේ පනත යටතේ වරදක් ව අදහස් කරනු ලැබූ ගණුදෙනුවකට හෝ වෙළෙඳාමකට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධ හෝ අදාළ යම් ලේඛනයක් යම් ස්ථානයක හෝ පරිශ්‍රයක ඇති බවට සැක කිරීමට හේතු ඇති බව දිවුරුම්දීමක් මත ලබා දී ඇති තොරතුරු මත මහේස්ත්‍රාත්වරයකු සෑහීමට පත්වන්නේ නම් ඔහු විසින් සෝදිසි වරෙන්තුවක් ප්‍රදානය කරමින් එම වරෙන්තුවේ නම් කර ඇති යම් නිලධරයකුට හෝ තැනැත්තකුට එම වරෙන්තුවේ දින සිට එක් මාසයක කාලයක් තුල කවර හෝ අවස්ථාවක දී ඔහුගේ සහායකයන් ඇතිව හෝ නැතිව අවශ්‍ය නම් බලය යොදා වරෙන්තුවේ නම් සඳහන් කර ඇති ස්ථානයට හෝ පරිශ්‍රයට ඇතුළු වී එම ස්ථානය හෝ පරිශ්‍රය සහ එහි තුළ සිටින තැනැත්තන් සෝදිසි කොට එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ තිබී හමු වූ නැතහොත් එහි යම් තැනැත්තකුගේ සන්තකයේ තිබී හමු වූ, යම් දෙයකට අදාළව මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බවට හෝ නැතහොත් එහි තිබී හමුවන යම් ලේඛනයක් ඉහත සඳහන් පරිදි වූ ලේඛනයක් බවට සැක කිරීමට හේතු ඇත්නම් එම ද්‍රව්‍ය හෝ ලේඛනය තහනමට ගෙන රඳවා තබා ගැනීමට එම වරෙන්තුව මගින් එම නිලධරයාට හෝ තැනැත්තාට බලය පවරනු ලැබිය හැකි ය. සෝදිසි වරෙන්තු.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් සෝදිසි කිරීමේ කාර්ය සඳහා එම උපවගන්තියේ සඳහන් යම් නිලධරයකුට හෝ තැනැත්තකු විසින් තත්කාර්ය සඳහා දෙන ලද යම් නියමයකට, විධානයකට හෝ සංඥාවකට අනුකූලව ක්‍රියා කරමින් යම් නැවක්, බෝට්ටුවක්, සතෙක්

හෝ වාහනයක් ඒවා භාරව සිටින තැනැත්තා විසින් නවත්වනු නොලැබුවහොත් එම නැව, බෝට්ටුව, සත්වයා හෝ වාහනය නැවැත්වීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය හැකි අතර, සියලු ක්‍රියා මාර්ග සහ බලය යොදවනු ලැබිය හැකි ය.

රහස්‍ය තොරතුරු හෙළිකිරීමට අදාළව උල්ලංඝනය කිරීම සඳහා වූ දඬුවම.

**36**. (1) (2) වන උපවගන්තියට යටත්ව ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයකින් හෝ වාර්තාවකින් අධිකාරිය ලබා ගත් යම් රහස්‍ය තොරතුරක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ පවත්වන ලද යම් පරීක්ෂා කිරීමක් අතරතුර දී පරීක්ෂකයකු හෝ ජාත්‍යන්තර පරීක්ෂකයකු හෝ පරීක්ෂණ කණ්ඩායමේ යම් සාමාජිකයකු වෙත කරන ලද යම් ප්‍රකාශයකින් හෝ සපයන ලද තොරතුරකින් හෝ ලබා ගත් යම් රහස්‍ය තොරතුරක්, ර. අ. ත. ස. හෝ වෙනත් රාජ්‍ය පාර්ශ්වයකින් ලබාගත් යම් රහස්‍ය තොරතුරක් වෙනත් යම් තැනැත්තකුට හෙළි කරන යම් තැනැත්තෙක්, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් නියමිත තොරතුරු අදාළ වන්නේ යම් තැනැත්තකුගේ කටයුතු සම්බන්ධයෙන් ද, එම තැනැත්තාගේ ලිඛිත කැමැත්ත ඇතිව හෝ—

(අ) සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් ඉටු කිරීමට ශ්‍රී ලංකාවට හැකිවීමේ කාර්ය සඳහා ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා,

පමණක් එම තොරතුරු හෙළි කරනු ලැබිය හැකි ය.

සාමාන්‍ය දණ්ඩන.

**37**. (1) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ නීත්‍යානුකූලව කරන ලද යම් නියමයක් හෝ විධානයක් නැතහොත් මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ප්‍රදානය කරන ද යම් බලපත්‍රයක, බලය පැවරීමක, අවසර පත්‍රයක හෝ අධිකාරී බලයක අන්තර්ගත යම් කොන්දේසියක් හෝ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදක් සිදු කිරීමට උත්සාහ කරන හෝ අනුබල දෙන සෑම තැනැත්තෙක්ම එම වරදට වරදකරු වන්නේ ය.

(3) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන විට—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම වරද සිදු කරන අවස්ථාවේදී එම පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයා, ලේකම්වරයා හෝ වෙනත් සමාන නිලධරයකු වශයෙන් සිටි සෑම තැනැත්තෙක්ම ; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන්නේ නම්, එම වරද සිදු කරන අවස්ථාවේ දී එහි සිටි සෑම තැනැත්තෙක්ම,

එම වරද සංයුක්තවන ක්‍රියාව ඔහුගේ අනුදැනුම හෝ කැමැත්ත නොමැතිව සිදු වූවේ නම් මිස, එම වරදට වරදකරුවකු ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ වරදකට වරදකරු වන සෑම තැනැත්තෙක්ම එම එක් එක් වරද සඳහා රුපියල් පත් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

**38**. (1) මේ පනත යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරන අධිකරණයක් විසින් මෙහි මින් පෙර නියමිත ඇති දණ්ඩනවලට අමතරව එම අධිකරණය විසින් සුදුසු යයි සළකනු ලබන්නේ නම්, වරද සිදු කරනු ලැබුවේ, යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද එකී සියලුම යම් භාණ්ඩයක් සහ එම භාණ්ඩය ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන ලද යම් දෙයක් තහනමට ගෙන රාජසන්තක කරන ලෙස එම අධිකරණය මගින් ආඥා කරනු ලැබිය හැකි ය. රාජසන්තක කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවනු ලැබූ රාජසන්තක කිරීම සඳහා වූ ආඥාවක්—

(අ) රාජසන්තක කිරීමේ ඒ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ යම් කාල පරිච්ඡේදයක් ඇතුළත ද ඒ කාල පරිච්ඡේදය

ඉකුත්වීමේ දී රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ අවස්ථාවක;

(ආ) ඒ රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ හා අභියාචනාධිකරණය ඒ ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාල පරිච්ඡේදය ඉකුත්වීමේ දී, ඒ රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරන හෝ පිළිගනු ලබන අභියාචනාධිකරණයේ ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ අවස්ථාවක;

(ඇ) ඒ රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ හා රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කෙරෙන හෝ පිළිගනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මත පළමුව සඳහන් කළ අභියාචනය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නිගමනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ අවස්ථාවක,

බලාත්මක විය යුතු ය.

නියෝග.

**39**. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්ම සහ (1) උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන සියලුම කාර්ය හෝ ඉන් යම් කාර්යයක් සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනත මගින් නියෝග සෑදීමට නියම කර ඇත්තේ හෝ බලය පවරා ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන්ද එම කාරණා සම්බන්ධයෙන් නියම, කොන්දේසි, සීමා හෝ වෙනත් සීමා කිරීම් නියම කිරීම සඳහා ;

(ආ) උපලේඛනවලින් යම් උපලේඛනයක යම් අයිතමයක් එකතු කිරීම හෝ යම් අයිතම ඉවත් කිරීම හෝ එම උපලේඛන වෙනස් කිරීම සුලු වශයෙන් වෙනස් කිරීම හෝ වෙනත් යම් ආකාරයකට සංශෝධනය කිරීම ;

(ඇ) (i) මේ පනත යටතේ අනුමතය ප්‍රදානය කල හැකි හෝ ප්‍රතික්ෂේප කල හැකි තැනැත්තන් එවැනි අවස්ථා සහ එසේ ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට යටත් වන්නේ යම් නියම සහ කොන්දේසිවලට ද එම නියම සහ කොන්දේසි නියම කරමින් ;

(ii) මේ පනත යටතේ අනුමතය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ආකාරය සහ ආකෘතිය සහ ඒවා පිළිබඳ ක්‍රියා කිරීමේ ආකාරය නියම කරමින් ;

(ඈ) මේ උපවගන්තියේ සඳහන් කාරණාවලට හෝ විෂයට ආනුෂංගික හො සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අනුනමතයේ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

40. යම් අධිකරණයක් ඉදිරිපිට අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගනු ලැබූ නඩු ගාස්තු රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. රජයේ නිලධරයන්ගේ ආරක්ෂාව.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත සංශෝධනය කිරීම.

41. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුවම පහත දැක්වෙන අයිතමය ඇතුලත් කිරීමෙන්, එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(48) 2007 අංක 58 දරන රසායනික අවි සම්මුති පනතේ අර්ථානුකූලව ආවරණය වූ වරදක්".

රාජ්‍ය සමග දැනට පවත්නා උදර්පන වැඩ පිළිවෙල මගින් මේ පනතේ වැරදි සඳහා විධිවිධාන සළස්වන බවට සළකනු ලැබිය යුතු බව.

42. මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් යම් රාජ්‍යයක් සමග උදර්පන වැඩ පිළිවෙලක් බලාත්මකව පවතින අවස්ථාවක, 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා එම වැඩ පිළිවෙලට මේ පනතේ නිශ්චිතව දැක්වෙන වැරදි සම්බන්ධයෙන් උදර්පනය කිරීම සඳහා විධිවිධාන ඇතුලත් වන බවට සළකනු ලැබිය යුතු ය.

මේ පනතේ වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඇතැම් සංධාන රාජ්‍ය අතර ඇති උදර්පන වැඩපිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් සම්මුතිය සලකනු ලැබිය හැකි බව.

43. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ යම් රාජ්‍යයක් අතර යම් උදර්පන වැඩ පිළිවෙලක් නොපවතින අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා මේ පනතේ නිශ්චිතව දැක්වෙන වැරදි සම්බන්දයෙන් උදර්පනය කිරීම සඳහා විධිවිධාන සළස්වමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ රාජ්‍ය අතර ඇතිකර ගත් උදර්පන වැඩ පිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයක් මගින් සම්මුතිය සළකනු ලැබිය යුතු ය.

උදර්පනය කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලබන්නේ යම් තැනැත්තන් සම්බන්ධයෙන්ද එම තැනැත්තන්ට එරෙහිව ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව ඉල්ලා සිටින රාජ්‍යයට දැනුම් දීමට අමාත්‍යවරයාට ඇති කාර්ය භාරය.

44. මේ පනතේ විස්තර කර ඇති වරදකට චෝදනා ලැබ සිටින හෝ වරදකරු වී සිටින යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් වැඩ පිළිවෙළකට එළඹී ඇති රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් වරද සඳහා එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීම හෝ ඔහුව උදර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගැනීමට යෝජිත පියවර සම්බන්ධයෙන් ඉල්ලා සිටින රාජ්‍යයේ ආණ්ඩුව වෙත වහාම දැනුම් දිය යුතු ය.

රාජ්‍යයකට සහය දීම.

45. (1) මේ පනතේ III වන කොටස යටතේ වරදක් විමර්ශනය කර නඩුපැවරීම සඳහා අවශ්‍ය කවර විටකදී වුවද, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය

රටවල් වන හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ගිවිසුමකට එළඹී ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් නොවන වෙනත් රාජ්‍ය සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අතර සහය ලබාදීම සම්බන්ධයෙන් විධිවිධාන අදාළ විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සුදුසු යයි සළකනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව රාජ්‍යයකට ලබා දෙන සහය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**46**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**47**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"බලයපවරන ලද විශ්ලේෂක" යන්නෙන්, රජයේ රස පරීක්ෂකවරයා, අතිරේක රජයේ රස පරීක්ෂකවරයා, නියෝජ්‍ය රජයේ රස පරීක්ෂකවරයා, ජ්‍යෙෂ්ඨ සහකාර රජයේ රස පරීක්ෂකවරයෙක් සහ සහකාර රජයේ රස පරීක්ෂකවරයෙක් අදහස් වේ ;

"රසායනික ද්‍රව්‍යය" යන්නෙන්, මෙම පනත අදාළ වන්නා වූද, මේ පනතේ I, II සහ III වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇත්තා වූද රසායනික ද්‍රව්‍ය අදහස් වේ ;

"රසායනික අවි" යන්නෙන්, පහත සඳහන් දේ එක්ව හා වෙන් වෙන්ව අදහස් වේ -

(අ) සම්මුතිය යටතේ තහනම් කරනු නොලැබූ කාර්ය සඳහා අදහස් කරනු ලබන අවස්ථාවලදී එම කාර්ය සඳහා වර්ග සහ ප්‍රමාණයන් අනුකූලවනතාක් දුරට එම ද්‍රව්‍යයන් හැර විෂ සහිත රසායනික ද්‍රව්‍ය සහ ඒවායේ පූර්වගයන් ;

(ආ) (අ) අනුඡේදයේ නිශ්චිතව දැක්වෙන විෂ සහිත රසායනික ද්‍රව්‍යවල විෂ සහිත ගතිලක්ෂණ හේතුකොටගෙන හෝ වෙනත් අනතුරක් සිදු කිරීමට විශේෂයෙන් නිර්මාණය කර ඇති යුද්ධ උපකරණ හෝ උපකරණ, මේවා නිකුත් කරනු ලබන්නේ එම

යුද්ධ උපකරණ හෝ උපකරණ සේවයේ නියුක්ත කරවීමේ ප්‍රතිඵලයක් වශයෙන්; සහ

(ඇ) (ආ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති යුද්ධ උපකරණ සහ උපකරණ සේවයේ නියුක්ත කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති යම් උපකරණයක්.

“පූර්වගයා” යන්නෙන්, විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් කවර ක්‍රමයකින් හෝ නිපදවීමේ දී යම් අදියරකදී යොදාගනු ලබන රසායනික ප්‍රති ක්‍රියා ඇති ද්‍රව්‍යයක් අදහස් වේ. මීට ද්විගුණ හෝ බහු සංඝටක රසායන ක්‍රමයක යම් ප්‍රධාන සංඝටකයක්ද ඇතුළත් වේ ;

“මේ සම්මුතිය යටතේ තහනම් නොකරන ලද කාර්ය” යන්නෙන්—

(අ) කාර්මික, කෘෂිකාර්මික, පර්යේෂණාත්මක, වෛද්‍ය, ඖෂධීය හෝ වෙනත් සාමකාමී කාර්යයන් ;

(ආ) ආරක්ෂක කාර්යයන්, එනම්, විෂ සහිත රසායන ද්‍රව්‍ය හෝ රසායනික අවි වලින් ආරක්ෂාවීම සඳහා කෙලින්ම අදාළ වන කාර්යයන් ;

(ඇ) රසායනික අවි භාවිතය හා සම්බන්ධකමක් නොමැති, යුධමය කාර්ය සහ යුද්ධමය ක්‍රියාමාර්ගයක් වශයෙන් රසායනික ද්‍රව්‍යවල විෂ සහිත ගති ලක්ෂණ භාවිතය මත රඳා නොපවතින යුධමය කාර්ය ;

(ඈ) දේශීය කැරලි කෝලාහල පාලනය කිරීමේ කාර්ය ඇතුළු නීතිය ක්‍රියාවේ යෙදවීම ;

“කැරලි කෝලාහල පාලන ද්‍රව්‍ය” යන්නෙන්, උපලේඛනයක ලැයිස්තුගත කර නොමැති වූද, මනුෂ්‍යයන් තුළ ඉන්ද්‍රිය දැවිල්ලක් කඩිනමින් ඇතිකරන්නා වූ ද, හෝ ශරීරය දුබල කරන්නා වූ ද, නිරාවරණය අවසානයේ දී ටික වේලාවකින් බලපෑම නැතිවන්නා වූ ද, ද්‍රව්‍යයක් අදහස් වේ;

"විෂ සහිත රසායනික ද්‍රව්‍ය" යන්නෙන් මේ පනතේ I, II සහ III වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති වූ ද, ස්වකීය රසායනික ප්‍රතික්‍රියා මගින් මනුෂ්‍යයන් හෝ සතුන් මියයාම, තාවකාලික අබලතාව හෝ ස්ථිර හානියක් සිදු කල හැකි වූද, රසායනික ද්‍රව්‍යයක් අදහස් වන අතර, ඊට ඒවායේ ආරම්භය හෝ නිෂ්පාදන ක්‍රමය, හෝ ඒවා යුධ උපක්‍රම වශයෙන් නිෂ්පාදනය කල ද, තැනුම් පොළක නිෂ්පාදනය කළ ද එම කරුණු නොතකා එම රසායනික ද්‍රව්‍ය මීට ඇතුළත් වේ ;

"උපලේඛනගත කරනු නොලැබූ වෙන්ව පවත්නා කාබනික රසායන ද්‍රව්‍යය" යන්නෙන් කාබන්වල ඔක්සයිඩ්, සල්ෆයිඩ්, මෙටල් කාබනේට්, හැර කාබන්වල සියලුම සම්මිශ්‍රණවලින් සංයුක්ත වන්නා වූ ද, රසායනික සම්මිශ්‍රණ පන්තියට අයත් වූ ද, යම් රසායනික ද්‍රව්‍යයක් අදහස් වේ. තවද, එම රසායනික ද්‍රව්‍යය එහි රසායනික නමින් හෝ ව්‍යුහගත සූත්‍රයෙන් සහ රසායනික උධෘත සේවා ලේඛන අංකයෙන් හඳුනාගත හැකි ය.

## I වන උපලේඛනය

| *(අ) විෂ රසායනික ද්‍රව්‍ය*<br>*රසායනික ද්‍රව්‍ය වල නම්* | *රසායනික කෙටි නාම සේවා ලේඛන අංකය* |
|---|---|
| (1) O-ඇල්කයිල් (£C10අන්තර්ගත සයික්ලෝඇල්කයිල්) ඇල්කයිල් (Me,Et,n-Pr හෝ i-Pr)- පොස්ෆොනෝ +ප්ලොරයිඩේට්ස් | |
| උදාහරණ : සරීන් : O- අයිසොප්‍රොපයිල් මීතයිල් පොස්ෆොනෝ+ ප්ලෝරයිඩේට් | (107-44-8) |
| සෝමාන් :O පිනකොලයිල් මීතයිල් පොස්ෆොනෝ ප්ලෝරයිඩේට් | (96-64-0) |
| (2) O < ඇල්කයිල් :(<C10 අන්තර්ගත සයික්ලෝඇලක්යිල්) **NN** - ඩයිඇල්කයිල් : (Me,Et, n-Pr i-Pr )-පොස්ෆොරැමයිඩෝ +සයනයිඩෝ සයනයිඩෙට්ස් | |
| උදාහරණ : ටැබුන් : O-ඊතයිල් N , N ඩයිමීතයිල් පොස්ෆෝරැමයිඩෝ සයනයිඩෙට් | (77-81-6) |
| (3) O ඇල්කයිල් :(H හෝ (<C10 අන්තර්ගත චක්‍රීය ඇල්කයිල් | |

සයික්ලෝඇල්කයිල්) < ඩයිඇල්කයිල් :
(Me, Et,n-Pr හෝ i-Pr)- ඇමයිනෝඊතයිල්
ඇල්කයිල් :
(Me, Et,n-Pr හෝ i-Pr)- පොස්ෆොනෝ තයෝලේට්
සහ ඊට අනුරූප ඇල්කලීකෘත හෝ හයිඩ්‍රජනීකෘත ලවණ

උදාහරණ : VX : O- ඊතයිල් S-2- ඩයිඅයිසෝ (50782-69-9)
ප්‍රොපයිල් ඇමයිනෝ ඊතයිල්
මීතයිල් පොස්ෆෝනෝතයෝලේට්

(4) සල්පර් මස්ටර්ඩ්ස් :
2-ක්ලෝරෝ ඊතයිල් ක්ලෝරෝ මීතයිල් සල්ෆයිඩ් (2625-76-5)
මස්ටර්ඩ් වායුව : Bis (2- ක්ලෝරෝ ඊතයිල්) සල්පයිඩ් (505-60-2)
Bis (2-ක්ලෝරෝ ඊතයිල්තයෝ) මීතේන් (63869-13-6)
සෙස්ක්වි මස්ටර්ඩ් : 1,2- Bis (2-ක්ලෝරෝ (3563-36-8)
ඊතයිල්තයෝ)එතේන්
1,3- Bis (2ක්ලෝරෝඊතයිල්තයෝ)-n- ප්‍රෝපේන් (63905-10-2)
1,4- Bis (2 ක්ලොරෝඊතයිල්තයෝ)-n-බියුටේන් (142868-93-7)
1,5- Bis (2(ක්ලෝරෝඊතයිල්තයෝ)-n- පෙන්ටේන් (142868-94-8)
Bis (2-ක්ලොරෝඊතයිල්තයෝ මීතයිල්) ඊතර (63918-90-1)
Bis (2-මස්ටර්ඩ්
O - මස්ටර්ඩ් : Bis (2- ක්ලොරෝඊතයිල්තයෝ ඊතයිල්) (63918-89-8)
ඊතර්

(5) ලෙවිසයිට්ස් :
ලෙවිසයිට් 1:2- ක්ලෝරෝවයිනයිල්
ඩයික්ලෝරෝආසීන් (541-25-3)
ලෙවිසයිට් 2 : Bis (2-ක්ලෝරෝවයිනයිල්) ක්ලෝරෝ
ආසීන් (40334-69-8)
ලෙවිසයිට් 3 : Tris (2-ක්ලෝරෝවයිනයිල්) ආසීන් (40334-70-1)

(6) නයිට්‍රජන් මස්ටර්ඩ්ස් :
HN1 : Bis (2-ක්ලොරෝඊතයිල්) ඊතයිල්ඇමයින් (538-07-8)
HN2 : Bis (2- ක්ලෝරෝඊතයිල්) මීතයිල්ඇමයින් (51-75-2)
HN3 : Tris (2-ක්ලොරෝඊතයිල්) ඇමයින් (555-77-1)

(7) සැක්සිටොක්සින් (35523-89-8)

(8) රෙසින් (9009-86-3)

(ආ) පූර්වගයන්

(1) ඇල්කයිල් (Me, Et, n-Prහෝ i-Pr)-
පොස්පෝනයිල්ඩයි ෆ්ලෝරයිඩ්ස්

උදාහරණ : DF: මීතයිල්පොස්පොනයිල් (676-99-3)
ඩයිෆ්ලෝරයිඩ්

(2) O-ඇල්කයිල් (H,හෝ £ C10 අන්තර්ගත සයික්ලෝ ඇල්කයිල්)
ඩයි ඇල්කයිල්
(Me,Et,n-Pr හෝ i-Pr) ඇමයිනෝඊතයිල්ඇල්කයිල්
(Me,Et,n-Pr හෝ i-Pr) පොස්පෝනයිට්ස් සහ ඊට
අනුරූප ඇල්කලිකෘත හෝ හයිඩ්‍රජනීකෘත ලවන

උදාහරණ : QL:O-ඊතයිල් O-2
ඩයිඅයිසෝප්‍රොපයිල් ඇමයිනෝ (57856-11-8)
ඊතයිල් මීතයිල් පොස්පොනයිට්

(3) ක්ලෝරෝ සරින් : O-අයිසොප්‍රොපයිල ඇමෝනියා පොස්පොනෝක්ලෝරයිඩේට්- (1445-76-7)

(4) ක්ලෝරෝසෝමාන්: O- පිනකොලයිල් මීතයිල් පොස්පොනෝක්ලෝරයිඩේට් (7040-57-5)

## II වන උපලේඛනය

(අ)-විෂ රසායනික ද්‍රව්‍ය

(1) ඇමිටොන් : O,O -ඩයිඊතයිල් S-[2- (ඩයි ඊතයිල් ඇමයිනෝ) ඊතයිල්] පොස්පොරෝතයෝලේට් සහ ඊට අනුරූප ඇල්කලීකෘත හෝ හයිඩ්‍රජනීකෘත ලවන (78-53-5)

(2) PFIB1, 1,3,3,3, -පෙන්ටාෆ්ලෝරෝ-2-
(ට්‍රයිෆ්ලෝරෝ මීතයිල්)- 1-ප්‍රොපේන් (382-21-8)

(3) BZ :3. ක්විනියුක්ලිඩයිනයිල් බෙන්සිලේට්* (6581-06-2)

(ආ) පූර්වගයන්

(1) 1 වන උපලේඛනයෙහි ලැයිස්තුගත කර ඇති රසායනික ද්‍රව්‍ය හැර ෆොස්පරස් පරමාණුවකට එක් මීතයිල්, ඊතයිල් හෝ ප්‍රොපයිල් (සාමාන්‍ය (n) හෝ අයිසෝ) (i) කාණ්ඩය බැඳී ඇත්තාවූ ද, එහෙත් තවත් කාබන් පරමාණු බැඳී නැත්තා වූ ද, පොස්පරස් පරමාණුවක් අන්තර්ගත රසායනික ද්‍රව්‍ය

උදාහරණ : මීතයිල් පොස්පොනයිල් ඩයික්ලෝරයිඩ් (676-97-1)
ඩයිමීතයිල් පොස්fපනේට් (756-79-6)
ව්‍යතිරේකය: පොනොපොස් O-ඊතයිල් S-පීනයිල් ඊතයිල්පොස්පෝනෝතයෝලෝතයෝනේට් (944-22-9)

(2) N,N -ඩයි ඇල්කයිල් (Me,Et,n-Pr හෝ I-Pr)
පොස්පෝරැමිඩික් ඩයි හේලයිඩ්ස්

(3) ඩයි ඇල්කයිල් (Me,Et,n-Pr හෝ i-Pr)
N,N - ඩයි ඇල්කයිල් (Me,Et,n-Pr හෝ i-Pr) (පොස්පෝරැමයිඩේට්ස්)

(4) ආසනික් ට්‍රයික්ලෝරයිඩ් (7784-34-1)

(5) 2,2-ඩයිපීනයිල්-2-හයිඩ්‍රොඇසිටික් අම්ලය (76-93-7)

(6) ක්විනියුක්ලිඩින්-3ඕල් (1619-34-7)

(7) N,N- ඩයි ඇල්කයිල් (Me,Et,n-Pr හෝ I-Pr) ඇමයිනෝ ඊතයිල්-2 ක්ලොරයිඩ්ස් සහ ඊට අනුරූප හයිඩ්‍රජනීකෘත ලවණ

(8) N,N- ඩයි ඇල්කයිල් (Me,Et,n-Pr හෝ I-Pr) ඇමයිනෝ ඊතේන්-2-ඕල් සහ ඊට අනුරූප හයිඩ්‍රජනීකෘත ලවණ

ව්‍යතිරේක : N,N- ඩයි මීතයිල් ඇමයිනෝ එතනොල් සහ ඊට අනුරූප හයිඩ්‍රජනීකෘත ලවණ (108-01-0)
N,N- ඩයි ඊතයිල් ඇමයිනෝ එතනොල් සහ ඊට අනුරූප හයිඩ්‍රජනීකෘත ලවණ (100-37-8)

(9) N,N- ඩයි ඇල්කයිල් (Me,Et,n-Pr හෝ I-Pr) හෝ ඇමයිනෝ ඊතේන්02- තියොල්ස් සහ ඊට අනුරූප හයිඩ්‍රජනීකෘත ලවණ

(10) තයෝඩයිග්ලයිකෝල් : Bis (2-හයිඩෝක්සි ඊතයිල්)සල්ෆයිඩ් (111-48-8)

(11) පිනකොලයිල් මධ්‍යසාරය : 3,3 - ඩයිමීතයිල් බියුටේන් -2-ඕල් (464-07-03)

## III වන උපලේඛනය

(අ)විෂ රසායනික ද්‍රව්‍ය

(1) පොස්ජීන් : කාබොනයිල් ඩයික්ලෝරයිඩ් (75-44-5)

(2) සයිනොජින් ක්ලෝරයිඩ් (506-77-4)

(3) හයිඩ්‍රජන් සයනයිඩ් (74-90-8)

(4) ක්ලෝරෝපික්රින් : ට්‍රයික්ලෝරෝනයිට්රෝමීතෙන් (76-06-2)

(ආ.) පූර්වගයන්

(1) පොස්පරස් ඔක්සික්ලොරයිඩ් (10025-87-3)

(2) පොස්පරස් ට්‍රයික්ලෝරයිඩ් (7719-12-2)

(3) පොස්පරස් පෙන්ටක්ලෝරයිඩ් (10026-13-8)

| | | |
|---|---|---|
| (4) | ට්‍රයි මීතයිල් පොස්පයිට් | (121-45-9) |
| (5) | ට්‍රයි ඊතයිල් පොස්පයිට් | (122-52-1) |
| (6) | ඩයිමීතයිල් පොස්පයිට් | (868-85-9) |
| (7) | ඩයි ඊතයිල් පොස්පයිට් | (762-04-9) |
| (8) | සල්පර් මොනො ක්ලෝරයිඩ් | (10025-67-9) |
| (9) | සල්පර් ඩයික්ලෝරයිඩ් | (10545-99-0) |
| (10) | තයෝනයිල් ක්ලෝරයිඩ් | (7719-09-7) |
| (11) | ඊතයිල් ඩයිඑතනෝල් ඇමයින් | (139-89-7) |
| (12) | මීතයිල් ඩයිඑතනෝල් ඇමයින් | (105-59-9) |
| (13) | ට්‍රයිඑතනෝල් ඇමයින් | (102-71-6) |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.